## කෙටි කතාව

පශ්චාත් නූතනවාදය ගැන කතා කිරීමේදී අමතක කළ නොහැකි නමක් වන ගේබ්‍රියෙල් ගාර්සියා මාකස් වෘත්තියෙන් පුවත්පත් කලාවේදියෙකි. 1962 දී සාහිත්‍යය පිළිබඳ නොබෙල් ත්‍යාගය දිනූ ඔහුගේ නිර්මාණ ඔබව ගෙන යන්නේ යථා ලෝකය හා මායාකාරී ලෝකය එකට එක්වන අපූරු චාරිකාවකය. ඇතැම් විචාරකයින් කියන්නේ එය විඥාණයේ පත්ලම ස්පර්ශ කරන්නාවූ ව්‍යායාමයක් බව ය. මාරකස් වරක් කියා ඇත්තේ ඔහු තම කථා සියල්ලටම පාදක වූයේ තම මිත්තනියගේ ඇසුරෙ ළමා කාලය ගෙවද්දී උකහා ගත් අත්දැකීම් බවයි. කථාවක පැහැදිලි මුලක් මැදක් හෝ අවසානයක් තිබීම අවශ්‍යම සාධකයක් නොවන බව ඔහු නිතරම ඇදහූ මතයකි. මාකස්ගේ කථා වල තවත් විශේෂයක් වන්නේ ඒවා තුලින් ඔහු ප්‍රකට කරන්නට උත්සාහ කරන දේශපාලන හා සමාජ දර්ශනයයි. මේ ඔහුගේ එක් කෙටිකතාවක් වන, Balthazar's marveloï afternoon හි සිංහල අනුවර්තනය යි.

# බල්තසාර්ගේ ප්‍රීතිමත් සන්ධ්‍යාව

ගේබ්‍රියෙල් ගාර්සියා මාකේස්

අනුවාදය



ඩබ්ලිව්.එච්. උපසේන



**කුඩුව** තනා නිමවුනා. බල්තසාර් එය තමන්ගෙ කුඩා වැඩ මඩුවෙ ඉස්සරහ වෙනද වගේ එල්ලල තිබ්බා. දවල් කෑම කාල ආපහු ආවම ඒක දැක්ක හැමෝම කිව්වෙ ලෝකෙ ලස්සනම කුඩුව මේක තමයි කියලයි. ආරංචිය හැම තැනම පැතිරිල සෙනග පිරෙන්න පටන් ගත්ත. බැරිම තැන බල්තසාර්ට සිද්ධවුනේ කුඩුව එතැනින් ඇතුලට අරන් වැඩමඩුව වහල දාන්නයි.

"දැන්වත් ඔය රැවුල බාල දාන්නකො." ඔහුලෙ බිරිඳ උර්සුලා කිව්වෙ තරමක කෝපයකින්. "ඔයා හිනං චඳුරෙක් වගෙයිනෙ."

"කෑම කාල රැවුල බාන්න හොඳ නෑ මිනිහ කිව්වා. "

ඇත්තම කිව්වොත් බල්තසාර් සුමාන දෙකකින් වත් රැවුල බාල තිබුනෙ නැහැ. කෙටි තියුණු රැවුල් ගස් හරියට පෙනුනෙ" කොටළුවෙකුගෙ බෙල්ලෙ යට තියෙන ලොං ගස් වගේ. හරියට හීනෙන් බය වෙච්ච ළමයෙක්ගෙ පෙනුම තමයි" ඒකෙන් මිනිහගෙ මූණට ඇවිත් තිබුනෙ.

මෙහෙම හදල ඉවුරුවුන කුඩුව ලෝකෙ හොඳම එක කියල කිව්වට මිනිහට ඒකෙ ගානවක්වත් තේරුමක් වත් තිබුනෙ නැහැ. පොඩිකාලෙ ඉඳලම සත්තුන්ට කුඩු හදන එක බල්තසාර් පුරුද්දක් වශයෙන් කර ආ එකක්. ඒක ඔහුට වෙන අයට වගේ අමුතු වැඩක් නෙවෙයි.

ඒ වෙනුවට වඩුමඩුවෙ බාර ගත්ත වැඩ ඉවර කරන්නෙ නැතිව සුමාන දෙකක්ම මේ කෙහෙල්මල් කුඩුවක් එක්ක ඔට්ටු වෙච්ච එක ගැන ඇය ඔහු එක්ක තරමක කේන්තියෙන් හිටියෙ. පහුගිය සති දෙකකටම මිනිහ නිදාගත්තෙ සුළු කාලයක් විතරයි. රැවුල බෑමක් ගැනවත් වෙනත් කිසිම වැඩක් පලක් ගැන අවධානයක් යොමු නොකර කුඩුව හදන එක ගැන විතරයි" මිනිහ තමන්ගෙ හිත යෙදෙව්වෙ. කෙටි නින්දෙන් ඇහැ ඇරෙන කොට උර්සුලා ඔහුට කමිසයක් හා කලිසමක් මැදල දීල ඇඳගාව පුටුව උඩ තබල තිබුනා. කුඩුව ගෙනිහින් තිබ්බ කෑම කන මේසෙ උඩ.

" කීයකටද මේ කුඩුව දෙන්න හදන්නෙ? " ඇය ඔහු ගෙන් ඇහුවා.

" මං දන්නෙ නැහැ. බල්තසාර් කිව්වා. මං හිතාගෙන ඉන්නෙ ඔය පේසෝ තිහක් විතර ඉල්ලන්න. අඩුගානෙ එතකොට විස්සක් වත් දෙයිනෙ."

"පනහක් ඉල්ලන්න. ඕක හදන්න ගිහින් කොච්චර නිදි මැරුවද? අනික මේක කොච්චර ලොකු එකක්ද? මංනං ජීවිතේට දැකල නැහැ මෙච්චර ලොකු කුඩුවක්. "

ඔවුන්ගෙ නිවස තිබුනෙ තුරු සෙවනක් යටයි. අප්‍රියෙල් මාසෙ උණුසුම දරා ගත හැකි මට්ටමක තිබුනා. ඇඳුම් ඇඳගෙන ඉවරවුනාම ඔහු ආයෙත් ඉස්සර මඩුවෙ දොර ඇරියම ආයෙත් ළමයි රොත්තක්ම කුඩුව බලන්න කෑම කන කාමරයට ගොඩ වැදුන.

ආරංචිය හැම තැනම පැතිරිල. මහලු වෛද්‍යවරයෙක් වන ඔක්ටාවියෝ ගිරාල්ඩෝ තමන්ගෙ ආබාධිත වෙලා ඉන්න බිරිඳ සමග දවල් කෑම කකා ඉන්න කොටයි.මේ ගැන දැන ගන්නට ලැබුනෙ. ඇය කුරුල්ලන්ට හරිම ආසයි. ඇයට තෑග්ගක් වශයෙන් මේ කුඩුව අරන් දෙන්න හිතපු දොස්තර මහත්තයා ලෙඩෙක් බලල එන ගමන්ටම බල්තසාර්ගෙ නිවසටත් ගොඩ වැදුන.

ඔහු යනකොටත් කෑම කන කාමරේ කුඩුව බලන්න ආපු මිනිස්සු ගොඩක් රැස්වෙලා උන්නා. කුඩුව ඇත්තටම බොහොම කදිමට නිර්මානය කරපු එකක් බව ඔහුට එකවරටම පෙනුන. කම්බි බොහොම සුමට විදියට එහාට මෙහාට නමල තට්ටු හා කොරිඩෝ ගණනාවක් එය තුල හදල තිබුනෙ අපූරු විදියටයි. කුරුල්ලට නිදා ගන්න හා කෑම කන්න වෙන වෙනම කාමර වෙන්කරල තිබුනා. විශාල අයිස් කර්මාන්ත ශාලාවක කුඩා ආකෘතියක් හැටියටයි" එය පෙනෙන්ට තිබුනෙ. මිනිස්සු විස්තර කළාටත් වඩා අගනා එකක් විදියටයි" දොස්තර එය දැක්කෙ. ඒ නිසා එය තමන්ගෙ බිරිඳට දෙන්න පුළුවන් අගනා තෑග්ගක් කියල ඔහු හිතුව.

"මේක නං අපූරු වැඩක්. . ඔහුට කියවුනා. " මිනිහකුට තමන්ගෙ සිතිවිලි කොච්චර ලස්සනට හසුරුවන්නට පුළුවන්ද කියන එක මේකෙන් කොච්චර හොඳට පේනව." ඔහු ඊට පස්සෙ සෙනග අතරෙ හිටපු බල්තසාර් දිහාට තම දෑස් විහිදෙව්වා.

" ඔහේ නං අපූරු හැකියාවන් තියෙන කෙනෙක් බව පේනව......""

බල්තසාර්ගෙ මුහුන ප්‍රීතියෙන් රතුවුනා." බො...බොහොම ස්තූතියි" දොස්තර මහත්තයො...."

"මේකෙ කුඩුවට කුරුල්ලෙක් නොදැම්මත් කමක් නැහැ.. මිනිහ සෙනග දිහාවට කුඩුව හැරෙව්වෙ හරියට ඒක වෙන්දේසියෙ දාන්න වගෙයි. "මේක නිකං ගහක එල්ලල තිබ්බම ඇති. කුරුල්ලෙක් වගේ කුඩුවම සින්දු කියන්න පටන් ගනීවි.ලලලලලල"

ඔහු නැවතත් කුඩුව මේසය උඩ තිබ්බා. මඳ වේලාවක් කල්පනා කළ ඔහු මෙහෙම කිව්වා.

" හොඳයි" මම මේක සල්ලි වලට ගන්නව. "

"අයියෝ දොස්තර මහත්තයො මේක විකුණලා ඉවරයිනෙ." උර්සුලා කිව්වා.

" ඔව් මේක මොන්ටියෙල් මහත්තයගෙ පුතා, චේපෙ පුංචි මහත්තයට හදපු එකක්. ඒ හන්ද එයාටයි මේක අයිති." බලතසාර් එය අනුමත කරමින් කිව්වා.

ඒ අදහසට බොහොම ගොරවාන්විත හිස නැමූ වෛද්‍යවරයා ආයෙ මෙහෙම ඇහුවා. ""එතකොට ඒ ළමය මේක හදන සැලැස්මක් බල්තසාරට දුන්නද?"

"නැහැ..".බල්තසාෘ කිව්වා. ඒ ළමය කිවවෙ ලොකු කුඩුවක් ඕන කියල විතරයි. ට්‍රුවුපියල් කුරුළු ජෝඩුවක් දාන්න."

වෛද්‍යවරයා කුඩුව දිහා බැලුවා.

" මිහු මං හිතන්නෙ නැහැ මේක කුඩුව ඒ කුරුල්ලන්ට ගැලපේවි කියල."

" නැහැ නැහැ මේක ඒ කුරුල්ලන්ට හොඳටම ගැලපෙනව." බල්තසාර් මේසය අසලට පැමිනෙමින් කිව්වා. " මේක හොඳින් ගණන් මිනුම් බලල හැදුව හදපු එකක්." එහි තිබෙන නොයෙක් කාමර දිහාවට ඇඟිල්ල දික් කරමිනුයි ඔහු කතා කළේ. ඉන්පසු ඔහු එහි බඳට සෙමෙන් තට්ටු කළාම දෝංකාර හඬක් නැංවුනා.

"හොයා ගන්න පුළුවන් හොඳම වයර් වලින් තමයි" මෙය හදල තියෙන්නෙ. ඒවා ඇතුලෙනුයි පිටිනුයි දෙකෙන්ම පාස්සල."

"මේක ගිරවෙකුට උනත් ඇති " ළමයෙක් කිව්වා.

ඒක ඇත්ත. බල්තසාර් කිව්වා.

වෛද්‍යවරයා තමන්ගෙ හිස එහෙ මෙහෙ හැරෙව්වා." කුඩුවක් හදන්න ඕඩරේ දුන්න එක හරි. නුමුත් එයා දුන්නෙ නෑනෙ ඒක හදන සැලැස්ම. කුරුළු ජෝඩුවක් දාන්න පුළුවන් කුඩුවක් හදන්න කියනව ඇරෙන්න ඒකෙ දිග පලල මෙහෙම වෙන්න ඕනි කියලවත් කිව්ව නං වැදගත් වෙනව. නිකං ලොකු කුඩුවක් හදන්න කියල තියෙනව විතරයි.........."

" ඒක හරි..." බල්තසාර් කිව්වා.

"ඒක තමයි මං කියන්නෙ. කුරුළු ජෝඩුවකට ඉන්න විශාල කුඩුවක් හදන්න කියල ඕඩරයක් දෙන එක වෙනම කතාවක්. මොකක් හරි සැලැස්මක් අනුව කුඩුවක් හදනව කියන එක තවත් කාරණාවක්. මේ වගේ මොකක් හරි නියම කරපු දිග පලලත් එක්ක කුඩුවක් හදන්න එයා ඔයාට කිව්ව කියල ඔප්පු කරන්න මොනව සාක්ෂියක් මෙතන නැහැ. ........."

"නුමුත් දොස්තර මහත්තයො මම මේක හැදුවෙ..... "බල්තසාර්ගෙ මොලෙත් ටිකක් අවුල් වුනා. " මම මේක හැදුවෙ එයා කියාපු හින්දනෙ."

වෛද්‍යවරයා ඔහු දෙස මහත් නොසන්සුන් බැල්මක් හෙලුවා.

" මං කියන්නං ඔයාට තවත් එකක් මේ වගේ හදන්නෙ පුළුවන්නෙ."අවුල ලිහන්න උරසුලා ඉදිරිපත් වෙමින් තම සැමියා දෙස බලා නැවතත් වෛද්‍යවරයා දිහා බැලුව." මම මෙයාට කියල තව එකක් හදල දෙන්නං දොස්තර මහත්තයට හදිසියක් නෑනෙ....."

එහෙත් වෛද්‍යවරුණ්‍යා ඒ අදහසට සතුටු වුනේ නැහැ. "මිහු මම මගේ නෝනට පොරොන්දු වුනේ අද හවස කුඩුවක් ගෙනැල්ල දෙනවම කියලයි."

"මට බොහොම කනගාටුයි දොස්තර මහත්තය. ඒත කාටවත් විකුනල තියනෙ දෙයක් මම කොහොමද තවත් කාට හරි විකුනන්නෙ. ඒක හරි නෑනෙ."

වෛද්‍යවරයා තමන්ගෙ උරහිස හකුලල බෙල්ලෙ දහඩිය ලේන්සුවකින් පිහිද ගත්ත. ඈතට පාවෙන නැවක් දිහා බලනව වගේ - තමන් කෙරෙන් ඈත්වී ගෙක යන වස්තුවක් කෙරේ ආසාවෙන් හා ශෝකයෙන් බලන බැල්ම සම්පූර්ණ කළා. " ඉතින් කීයක් ඒ ගොල්ලො මේකට බල්තසාර්ට ගෙවන්න යනවද?"

බල්තසාර් කිසිවක් නොකියා උර්සුලා දෙස බැලුවේ පිලිතුරක් බලාපොරොත්තුවෙන්.

"පේසෝ හැටක්..." ඇය කිව්වා.

වෛද්‍යවරයා කුඩුව දෙස නැවතත් බැලුවා. " මේක හරිම ලස්සනයි. ඔහු සුසුමත් හෙලුවා. හරිම ලස්සන කුඩුවක්.. " කුඩුව ගැන ආසාව සිතින් බැහැරලූ ගතියත් ඉන්පසු ඔහුගේ මුහුණින් දිස්වුනා.

"හ්ම් ...හ්ම් මොන්ටියෙල් බොහොම පොහොසත් කෙනෙක්නෙ." මිනිහ යන්න ගියා.

දවල් ආහාරයෙන් පස්සෙ නින්දක වැටී සිටි මොන්ටියල්ගෙ බිරිඳ හදිසියේ ඇසුනු

ළමයා එතැනට රැඳී හිටියෙ ගල් ගැහිල වගේ. ඔහු ඇහි පිහ ගැහුවෙත් නැහැ. ඒත් එක පාරටම මිනිහ බල්ලෙක් උඩු බුරලනව වගේ ශබ්දයක් නගමින් බිම පෙරලුනා. ඊට පස්සෙ කෑ ගහන්න පටන් ගත්ත.

මිනිසුන්ගේ ඝෝෂාවෙන් කලබලයට පත්වී දොර ජනෙල් ඇර බැලුවා. විශාල සෙනගක් ගේ ඉස්සරහ. කුඩුව එල්ල ගත්ත බල්තසාර් පිරිසේ මැදට වෙලා ඉන්නවා. රැවුල බාල සුදු ඇඳුම් කට්ටලයකින් සැරසුනු ඔහුගේ අවංක නිහතමානී. චාම් පෙනීම මේ වගේ තැනකට කොහෙත්ම ගැලපෙන වගක් තිබුනෙ නැහැ.

"ආනේ කොච්චර ලස්සන කුඩුවක්ද? ඇයට ඉබේටම කියවුනා. එය හරියට ගේ තුලටම බල්තසාර් කැඳවන ආරාධනයක් වගේ වුනේ."

සෙනග එලියේ ඉන්න ඇරල ගේ තුලට ආව බල්තසාර්ට මොන්ටියල්ගෙ ගෙදර අමුතු තැනක් නෙවෙයි. සුබ සුබ අඹත්වැඩියා වැඩ වලට එහෙ නිතරම ගොහින් තිබුනා. ඒත් පොහොසතුන් අතර මේ තරම් පහසුවෙන් හා සැහැල්ලුවෙන් ඉඳල පුරුද්දක් මිනිහට තිබුනෙ නැහැ මීට ඉස්සර. ඕනෑම දේකට වාද විවාද වලට පැටලෙන පොහොසත් ගැහැනු ගැන ඒ අය කර ගන්නා නානාප්‍රකාර ශල්‍යකර්ම ගැන විකාර විස්තර ඒවයෙ අගක් මුලක් වත් මිනිහට තේරෙන්නෙ නැහැ.

"කෝ පේපෙ පුංචි මහත්තය ඉන්නවද? "

"එයා ඉස්කෝලෙ දැන් ඒවී. මොන්ටියෙල්

24 වන පිටුව